ශ්‍රී ලංකාවට නැවතත් විදෙස් සංචාරකයන් පැමිණීම පිළිබඳව, "ඔන්න ආයෙත් වැල්ලට සුද්දෝ ඇවිත්" යන සිරස්තලය යටතේ ඉරිදා දිවයින පුවත්පතේ (10/17) ලිපියක් පළ වී තිබිණි. ඒ හා සමාන පුවතක් දිනමිණ පුවත්පතේ (10/21) පළ වී තිබුණේ, "පැරැලියට සංචාරකයෝ ඇවිත්" යන සිරස්තලය සමඟිනි.

පොදුවේ සමේ වර්ණය පදනම් කරගනිමින් බොහෝ විදෙස් සංචාරකයන් "සුද්දන්" ලෙස හැඳින්වීමේ ප්‍රවණතාවයක් ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. නමුත්, එලෙසින් ඔවුන් හැඳින්වීම තුළින්, ඔවුන්ගේ සමේ වර්ණය පදනම් කොටගනිමින් සිදුවන කොන් කිරීමක් සිදුවෙතැයි ඔබ නොසිතන්නේද?

මේ අනුව, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නේ මෙම සිරස්තල දෙකින් කුමක්ද?

1) ඔන්න ආයෙත් වැල්ලට සුද්දෝ ඇවිත්
2) පැරැලියට සංචාරකයෝ ඇවිත්

**#MediaEthicsSL #lka #sinhalanews #SundayDivaina #Dinamina**